**අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය - 2017**
**-----------------------------------------------------------------------**

අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2005 අංක 32 දරන අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩල පනතේ iv වන කොටසේ 29 වන වගන්තිය සමඟ සංයෝජිතව කියවියයුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් මණ්ඩලයේ සභාපතිවරයා වෙත 2018 අගෝස්තු 23 දින ඉදිරිපත් කරන ලදී.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**
**-------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**
**-----------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4** **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**---------------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2.** **මූල්‍ය ප්‍රකාශන**

**-----------------**

**2.1** **තත්ත්වාගණනය කළ මතය**

**--------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතිතන මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2** **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**------------------------------------------**

**2.2.1** **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති**

**--------------------------------------------**

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ඇස්තමේන්තු ප්‍රතිශෝධනයක් ලෙස ගැලපිය යුතු මණ්ඩලයේ රථ වාහන හා වායු සමීකරණ යන්ත්‍ර ක්ෂය වෙන් කිරීමේ ප්‍රතිශතය සියයට 20 සිට සියයට 12.5 දක්වා අඩුකිරීම, අතීතානුයෝගීව ගැලපීම හේතුවෙන් ජංගම නොවන වත්කම් අගය රු.14,811,960 ක් වැඩියෙන් දක්වා තිබුණි.

**2.2.2** **ගිණුම්කරණ අඩුපාඩු**

**-------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විගණනයේදී සිදුකරන ලද ගණනය කිරීම් අනුව සමාලෝචිත වර්ෂය සඳහා වායු සමීකරණ යන්ත්‍ර හා රැහැන් රහිත අන්තර්ජාල සම්බන්ධතාවය (WIFI) සඳහා පිළිවෙලින් රු.6,068 ක් හා රු.1,359 ක් අඩුවෙන් ක්ෂය වෙන්කර තිබුණි.

(ආ) බැංකු තහවුරු කිරීමේ ලිපිය (Bank Confirmation) අනුව ගිණුම් අංක 79821576 දරන ස්ථාවර තැන්පත් ගිණුමේ ශේෂය රු.1,925,194 ක් වුවද එම වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල රු.1,891,425 ක් ලෙස රු.33,769 ක් අඩුවෙන් දක්වා තිබුණි.

**2.2.3** **පැහැදිලි නොකළ වෙනස්කම්**

**--------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය කාර්යසාධන වාර්තාවට අනුව මණ්ඩලයේ මෙහෙයුම් ආදායම රු.36,033,468 ක් වුවද, ජාතිය ගොඩනැගීමේ බදු වාර්තා අනුව හා එකතු කළ අගය මත බදු වාර්තා අනුව එම ආදායම පිළිවෙලින් රු.37,288,835 ක් හා රු.37,657,571 ක් විය. එම ආදායමේ වෙනසට හේතු විගණනය වෙත ඉදිරිපත් නොවුණි.

(ආ) 2017 මාර්තු 31 දිනෙන් අවසන් කාර්තුව සඳහා පිළියෙල කරන ලද එකතු කළ අගය මත බදු වාර්තාවට අනුව එම දිනට ලැබිය යුතු එකතු කළ අගය මත බදු වටිනාකම රු.58,343 ක් වුවද 2017 ජුනි 30 දිනෙන් අවසන් කාර්තුව සඳහා පිළියෙල කරන ලද බදු වාර්තාවේ ආරම්භක ශේෂය ලෙස එම වටිනාකම රු.39,796 ක් ලෙස රු.18,547 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) 2017 ජනවාරි 01 දිනට සේවක පාරිතෝෂික වෙන් කිරීම් ශේෂය ලෙජරයට අනුව රු.2,767,825 ක් වුවද, සේවක පාරිතෝෂික වෙන් කිරීම් උපලේඛනයට අනුව එම ශේෂය රු.3,142,831 ක් වීමෙන් රු.375,006 ක වෙනසක් නිරීක්ෂණය විය.

## 2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීතිරීති හා රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ VIII වන පරිච්ඡේදයේ 9.2 වගන්තිය | මණ්ඩලයේ සේවකයින් 06 දෙනෙකු විසින් 2017 වර්ෂය තුලදී සති අන්ත හා රජයේ නිවාඩු දිනවල රාජකාරි කටයුතුවල යෙදී සිට එම දිනයන් වෙනුවෙන් හිලව් නිවාඩු හා අතිකාල යන ප්‍රතිලාභ දෙකම ලබාගෙන තිබුණි. මෙලෙස ලබාගත් අතිකාල දීමනාවල වටිනාකම රු.23,939 ක් විය. |
| (ආ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.14.2 වගන්තිය | මානව සම්පත් කළමනාකරණය සම්බන්ධයෙන් කාර්යාලීය අත්පොතක් කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය සහිතව 2013 වර්ෂයේදී නිකුත් කර තිබුණද ඒ සඳහා භාණ්ඩාගාර ලේකම්ගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. |

# 3. මූල්‍ය සමාලෝචනය

## 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මණ්ඩලයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.1,686,862 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.4,407,870 ක් වූයෙන්, ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.2,721,008 ක අඩුවීමක් නිරීක්ෂණය විය. 2016 වර්ෂයට සාපේක්ෂව 2017 වර්ෂයේදී ගිවිසුම්ගත සේවා වියදම් රු.5,814,377 කින් වැඩිවීම අතිරික්තය අඩුවීමට හේතුවී තිබුණි.

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 වර්ෂයේදී රු.59,633 ක්වූ අතිරික්තය උච්ඡාවචනයන් සහිතව 2017 වර්ෂයේදී රු.1,686,862 ක්වී තිබුණි. කෙසේවුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික, ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය වීම් හා රජයට ගෙවූ බදු නැවත ගැලපීමේදී 2013 වර්ෂයේදී රු.4,929,845 ක් වූ දායකත්වය 2014 වර්ෂයේදී රු.11,179,018 ක් දක්වා වර්ධනය වී 2015 වර්ෂයේදී රු.10,034,264 දක්වා අඩුවී තිබුණි. 2016 වර්ෂයේදී එය රු.29,593,390 ක් දක්වා වැඩිවී තිබුණද සමාලෝචිත වර්ෂයේදී රු.27,189,141 දක්වා අඩුවී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

#### 4.1.1 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

2005 අංක 32 දරන අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩල පනතේ 3(අ) හි සඳහන් කර්තව්‍ය ඉටුකර ගැනීම සඳහා මණ්ඩලය විසින් හඳුනාගත් ක්ෂේත්‍ර 09 ක් යටතේ ප්‍රතීතනය සිදුකර තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2017 දෙසැම්බර් 31 දිනට ක්‍රමාංක ආයතන ප්‍රතීතනය සඳහා අයදුම්පත් 10 ක් ලැබී තිබුණද, එයින් 7 ක් පමණක් ප්‍රතීතනය කර තිබු අතර පුද්ගල සහතික කිරීමේ ආයතන හරිතාගාර වායු සහතිකකරණ ආයතන හා යහපත් පරීක්ෂාගාර භාවිතය පිළිබඳ ප්‍රතීතනය යන ක්ෂේත්‍ර 3 හි ආයතන 4 ක් පමණක් ප්‍රතීතන සහතික ලබාගෙන තිබුණි.

(ආ) ක්ෂේත්‍ර 05 ක ප්‍රතීතන සහතිකය ලබාගෙන තිබූ ආයතන 142 කින් ආයතන 30 ක් ප්‍රතීතනයෙන් ඉවත්ව ගොස් තිබුණි. මේ අනුව ආයතනය විසින් ප්‍රතීතන සහතික ලබාගැනීමෙන් ඉවත්වීමේ ප්‍රවණතාවයක් පවතින අතර ප්‍රතීතන සහතික ලබාගැනීම පිළිබඳව ආයතනවල නැඹුරුතාවය ඇතිකරලීමේ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම කෙරෙහි අවධානය යොමුකර නොතිබුණි.

### 4.2 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2011 සැප්තැම්බර් 01 දින සිට අතිරේක අධ්‍යක්ෂ තනතුර පුරප්පාඩුව පවතින අතර, එම තනතුරට බඳවා ගැනීම සඳහා 2012 වර්ෂයේ සිට කටයුතු සැලසුම් කර තිබුණද 2018 ජූලි 31 දින වනවිටත් අදාල බඳවා ගැනීම් සිදුකර නොතිබුණි. කෙසේවුවද 2014 ඔක්තෝබර් 14 දිනැති අංක ඩීඑම්එස්/1601 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ ලිපිය ප්‍රකාරව වසරින් වසර කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීමේ පදනම මත එම තනතුර සඳහා නිලධාරියෙකු බඳවා ගැනීමට අනුමැතිය ලැබී තිබුණද ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ගගෙන හෝ නොතිබුණි.

(ආ) 2016 ජූලි 16 දින පුරප්පාඩු වූ කණිෂ්ඨ කළමනාකරු (ලේකම්) තනතුරු 01 ක්, 2015 ජූලි 30 දින පුරප්පාඩු වූ තාක්ෂණ නිලධාරී (තොරතුරු තාක්ෂණ) තනතුරු 01 ක් හා 2015 අගෝස්තු 24 දින පුරප්පාඩු වූ රියදුරු තනතුරු 01 ක් සඳහා 2018 මැයි 31 වන විටත් බඳවා ගැනීම් සිදුකර නොතිබුණි.

## 5. තිරසාර සංවර්ධනය

### 5.1 තිරසාර සංවර්ධන අරමුණු ලඟා කර ගැනීම

තිරසාර සංවර්ධන ඉලක්ක ලඟා කර ගැනීමට සූදානම් වීමේදී අනෙකුත් ආයතන සමඟ මනා සම්බන්ධීකරණයක් නොකිරීම හේතුවෙන් ඉලක්කගත අරමුණු කර ලඟා වීමට සැලසුම් සකස් කිරීමේ හා පෙර සූදානම් වීමේ ක්‍රියාවලිය ඉතා මන්දගාමී හා දුර්වල තත්ත්වයක පැවති බව නිරීක්ෂණය විය.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | කාර්යසාධනය | ක්‍රියාකාරී සැලැස්මට අනුව කාර්යයන් උපරිමව ඉටුකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකර නොතිබීම. |
| (ආ) | මානව සම්පත් කළමනාකරණය | පුරප්පාඩුව පවතින තනතුරුවලට නිලධාරීන් බඳවා ගැනීමට නිශ්චිත පියවරයන් ගෙන නොතිබීම. |